# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1804/17 - 2013 අප්‍රේල් මස 03 වැනි බදාදා - 2013.04.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනු ව්‍යවස්ථාව සහ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2013 අප්‍රේල් මස 03 වැනි දින,
කොළඹ දී ය.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි 2013 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි නමින් හඳුන්වනු ලැබේ.

2. සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 87.02, 87.03, 87.04 සහ 87.05 යටතට වැටෙන ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන පාවිච්චි කල වාහන පූර්ව නැව්ගත කිරීම් පරීක්ෂාවකට ලක් කරනු ලැබිය යුතු අතර, මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන අදාළ බලයලත් පරීක්ෂකවරුන් විසින් අපනයන පරීක්ෂණ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු වේ.

3. උක්ත අපනයන පරීක්ෂණ සහතිකය පහත සඳහන් අයුරින් සකස් වී තිබිය යුතු ය.

   (අ) පරීක්ෂකවරු විසින් සත්‍ය භාවය සහතික කර, පරීක්ෂකවරුන්ගේ ආයතනයේ නිල මුද්‍රාව යොදා, ලැමිනේට් කරන ලද වාහනයේ ලියාපදිංචිය අවලංගු කිරීමේ සහතිකයක්, හා අපනයන පරීක්ෂණ සහතිකයක්,

   (ආ) පරීක්ෂා කරන ලද වාහනයේ උපාංග ලැයිස්තුවක් සඳහන් වූ සවිස්තරාත්මක තත්ත්ව පරීක්ෂණ වාර්තාවක්,

4. උක්ත 3 (අ) සහ 3 (ආ) යටතේ සපයන ලේඛන සහ මුල් ලියාපදිංචිය අවලංගු කිරීමේ සහතිකය සහ එහි ඉංග්‍රීසි පරිවර්තනය ණයවර ලිපිය යටතේ මින් මතුවට අනුගම්‍ය වන්නා වූ ලේඛන බවට පත් වේ.

5. අවලංගු කළ ලියාපදිංචි සහතිකය සහ එහි ඉංග්‍රීසි පරිවර්තනයේ ද නියෝග 3(අ) (හෝ එහි සහතික පිටපතක) සහ 3(ආ) යටතේ දැක්වෙන ලේඛනයන්හි, ණයවර ලිපිය විවෘත කරන දේශීය බැංකුවේ සහ අපනයනය කරනු ලබන රටේ නියෝජිත බැංකුවේ නිල මුද්‍රා සටහන් විය යුතු ය.

1A - PG 001597 — 1035 (2013/04)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

6. වාණිජ බැංකු විසින්, ඔවුන්ගේ නියෝජිත බැංකුව මගින් සෘජුවම එවනු ලබන ලේඛන පමණක් භාරගනු ලැබිය යුතු අතර, අපනයනකරු, ආනයනකරු හෝ වෙනයම් පුද්ගලයෙකු විසින් එවනු ලබන, වාහනය ලියාපදිංචිය අවලංගු කිරීමේ සහතිකය හෝ එහි ඉංග්‍රීසි පරිවර්තනය හෝ අපනයන පරීක්ෂණ සහතික 3(අ) (හෝ එහි සහතික පිටපතක්) හෝ 3(ආ) යටතේ සඳහන් ලේඛනවලට, බැංකුවේ නිල මුද්‍රා සටහන් නොකළ යුතු වේ.

7. තථ්‍යභාවය සහතික කිරීම

7.1 නියෝග 3(අ) සහ 3(ආ) හි සඳහන් ලේඛන මින් මතුවට ශ්‍රී ලංකා රේගුවෙන් වාහන නිදහස් කර ගැනීමට අදාළ අනුගම්‍ය ලේඛන වේ.

8. අර්ථ දැක්වීම

8.1 බලයලත් පරීක්ෂකවරුන් යන්නෙන් අදහස් කරනුයේ ඃ

(i) ජපානයෙන් ආනයනය කිරීමකදී - ජපන් වාහන තක්සේරු ආයතනය (Japan Auto Appraisal Institute) (විද්‍යුත් තැපැල් ලිපිනය - mail@jaai.or.jp)

(ii) ජපානයෙන් ආනයනය කිරීමකදී - ජපන් එක්ස්පෝට් වෙහිකල් ඉන්ස්පෙක්ෂන් සෙන්ටර් කම්පැනි ලිමිටඩ් (Japan Export Vehicle Inspection Center Co., Ltd) (විද්‍යුත් තැපැල් ලිපිනය - info@jevic.com)

(iii) ජපානයෙන් ආනයනය කිරීමකදී - යූ එස් එස් කම්පැනි ලිමිටඩ් (USS Co., Ltd) (විද්‍යුත් ලිපිනය - tokyo@ussnet.co.jp)

(iv) අනෙකුත් කවර හෝ රටකින් ආනයනය කිරීමකදී - බියුරෝ වෙරිටාස් කාර්යාංශය (Bureau Veritas) (විද්‍යුත් ලිපිනය -itd.sgp@sg.Bureauveritas.com)

(v) බියුරෝ වෙරිටාස් (Bureau Veritas) කාර්‍යාංශයක් නොමැති විටක හෝ වෙනත් හේතුවකදී මුදල් අමාත්‍යාංශයේ ලේකම්/ආනයන හා අපනයන පාලක අනුමත කළ පරීක්ෂණ බලධාරියෙක්

8.2 මෙම නියෝග යටතේ පාවිච්චි කළ වාහනයක් යන්නෙන් අදහස් කරනුයේ, නිෂ්පාදිත රටේ හෝ අපනයනය කළ රටේ ලියාපදිංචි කරන ලද වාහනයක්.

2006 ජූලි මස 21 වැනි දිනැති අංක 1454/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2006 අංක 01 දරන ආයනය හා අපනයන (පාලන) රෙගුලාසි මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

04 - 496

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.